**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 29/03/2021

---

පැමිණිලි පාර්ශවය : 01. සී.යූ. කප්පාගොඩ මිය, - $HRC/AP/68/2018(S)$
අංක 2960, 111 පියවර,
අනුරාධපුර.

02. සී.ජේ. විජයසුන්දර මයා, - $HRC/AP/237/2018(S)$
මිහින්තලා පාර,
ගල්කුළම.

වගඋත්තර පාර්ශවය : 01. විදුහල්පති,
මධ්‍ය මහා විද්‍යාලය,
අනුරාධපුර.

02. අධ්‍යක්ෂ (ජාතික පාසල්),
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංක : $-HRC/AP/68/2018(S)$ , $HRC/AP/237/2018(S)$</u>

$HRC/AP/68/2018(S)$ –:

ඉහත අංක දරණ පැමිණිල්ලට අදාළව කරුණු ඉදිරිපත් කරමින් එහි පැමිණිලිකාරිය වන සී.යූ කප්පාගොඩ යන අය සඳහන් කර ඇත්තේ, තම දියණිය වන ඩබ්ලිව්.වී.ඩී. දෙව්මි ශාක්‍ය විතානගේ 2016 වසරේ පැවති 5 වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 162ක් ලබා ගෙන සමත් වූ බවත්, අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට ඇතුල්වීම සඳහා කඩඉම් ලකුණු තම දියණිය සපුරා නොසිටි බැවින් එම විද්‍යාලයේ 6 වසරට ඇතුළත් වීමට නොහැකි වූ බවත්ය.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541 / 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர்: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு: 1996
වෙබ් / இணையம்: www.hrcsl.lk

2018 වසරේ 7 ශ්‍රේණියට දියණිය ඇතුළත් කිරීම සඳහා අයදුම්පත්‍රයක් යොමුකළ බවත්, නමුත් තම දියණිය 2018 වසරේ 7 ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා කටයුතු නොකළ බවත්, තම දියණියට වඩා ශිෂ්‍යත්ව විභාගයෙන් අඩු ලකුණු ලබා සිටින දරුවන් අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් කර ඇති බවත්, එමගින් තම දරුවාට අසාධාරණයක් සිදුව ඇති බවත්ය.

HRC/AP/237/2018(S) :-

පැමිණිලිකාරිය තම පැමිණිල්ල මගින් ප්‍රකාශ කර ඇත්තේ, තම දියණිය තරුෂි ඉරාෂා ගුණරත්න 2016 වසරේ පැවති ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 166ක් ලබාගෙන සමත්ව ඇති බවත්, එම වසරේ අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය වෙත ළමුන් ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණු ප්‍රමාණය ලකුණු 169ක් වූ බවත්ය.

නමුත් ශිෂ්‍යත්ව කඩඉම් ලකුණු 169ට වඩා අඩු ලකුණු ලබාගත් දරුවන් අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලය වෙත ඇතුළත් කර ගෙන ඇති බවත්, මෙමගින් තම දරුවාට අසාධාරණයක් වූ බවත් පැමිණිල්ලෙන් දක්වා ඇත.

**වගඋත්තර පාර්ශවීය කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වාර්තාවක් යොමු කරමින් අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)ගේ 2018.12.05 හා අංක *ED/01/06/01/12/20* දරණ ලිපිය මගින් දන්වා ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික පාසල් ශාඛාව මගින් පවත්වාගෙන යනු ලබන අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ අතරමැදි ශ්‍රේණිවලට සිසුන් ඇතුළත් කිරීමේ ගොනුව පරීක්ෂා කිරීමේදී 2018 වර්ෂයේ 7 ශ්‍රේණිය සඳහා එම ශාඛාව මගින් සිසුන් ඇතුළත් කර නොමැති බවය.

**පැමිණිල්ලට අදාළව වගඋත්තරකාර අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ කරුණු දැක්වීම :-**

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති විසින් 2018.08.02 වන දින වාර්තාවක් යොමු කරමින් දන්වා ඇත්තේ, පැමිණිල්ලේ සඳහන් සිසුන් අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට ඇතුළත් කරගෙන ඇත්තේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ අනුව වන බවය.

**නිරීක්ෂණ :-**

මෙම පැමිණිල්ල මගින් ඉහත සඳහන් පැමිණිලිකරුවන් ප්‍රධාන කොටම ප්‍රකාශ කර ඇත්තේ, අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ 7 ශ්‍රේණියට 2018 වර්ෂය තුළ ඇතුළත් කර ඇති දරුවන් පැමිණිල්ලේ නම් සඳහන් දරුවන් දෙදෙනාට වඩා අඩු ලකුණු ලබා ඇති අය බවත්, මෙම සිසුන් බඳවා ගැනීම සඳහා කිසිදු සම්මුඛ පරීක්ෂණයක් සිදුකර නොමැති බවත්ය.

2008/37(1) දරණ හා 2008.10.30 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නිකුත් කර ඇති චක්‍රලේඛනය මගින් 2 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත.

මෙම චක්‍රලේඛනයේ සඳහන් කරුණු 3.2(ආ) අනුව ඉල්ලුම් කරන ලද අයදුම්කරුවන් පාසලේ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා වැඩි වන්නේ නම් පමණක් තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් පිහිටුවිය යුතු බව දන්වා ඇත.

අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ 2018 වසරේ 7 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් වගඋත්තරකරුවන් හා පැමිණිලිකරුවන් විසින් ඉදිරිපත් කර ඇති තොරතුරු අනුව සිසුන් 13 දෙනෙකු ඇතුළත් කරගෙන ඇති බව නිරීක්ෂණය වේ.

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් පවත්වනු ලැබූ පරීක්ෂණය සඳහා අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා පෙනී සිට ඇති අතර, පරීක්ෂණයේදී ඔහු ප්‍රකාශ කර ඇත්තේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශ මත පමණක් සිසුන් ඇතුළත් කර ගත් බවයි.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත ඇතුළත් කර ගත් සිසුන් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වා නොමැති බැවින් සම්මුඛ පරීක්ෂණයකට අදාළ කරුණු විදුහල්පතිවරා විසින් ලබාදී නැත.

7 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා සිසුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනයේ සඳහන් කරුණු අනුව සිසුන් ඇතුළත් කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේදී 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේදී සිසුන් ලබා ගත් ලකුණු සලකා බැලීමටත්, අදාළ දරුවා ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටි වර්ෂයේදී අදාළ පාසල් සඳහා තීරණය වූ අවම ලකුණු සලකා බැලිය යුතු බවටත් චක්‍රලේඛනයේ 3.4(ආ) *i* හා *ii* යටතේ දක්වා ඇති නමුත්, 2018 වසරේදි 7 ශ්‍රේණියට ඇතුළත් කර ගෙන ඇති සිසුන්ගේ නම් ලයිස්තුව පරීක්ෂා කර

බැලීමේදී 5 වසර ශිෂ්‍යත්ව විභාගයේදී ලබාගත් ලකුණු පිළිබඳව සැළකීමක් නොකර සිසුන් ඇතුළත් කර ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයට 2018 වසරේ 7 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේදී 2008.37(1) චක්‍රලේඛනයේ කිසිදු නිර්නායකයක් උපයෝගී කර නොගනිමින් කිසිදු සම්මුඛ පරීක්ෂණයක් නොපවත්වා චක්‍රලේඛනයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත පමණක් පදනම්ව සිසුන් 13 දෙනෙකු ඇතුළත් කරගෙන ඇති බව නිරීක්ෂණය වේ.

අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2008/37(1) දරණ චක්‍රලේඛනය ප්‍රකාරව කටයුතු කිරීමට කිසිදු සැලසුම් කිරීමක් හෝ කර නොමැති බවටත්, 7 ශ්‍රේණියට ඇතුල්වීම සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කරන ලද සිසුන්ට කිසිදු සම්මුඛ පරීක්ෂණයකට මුහුණදීමට ඉඩ ලබා නොදී අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය අනුවම පමණක් සිසුන් ඇතුලත් කර ගැනීමට කටයුතු කර ඇති බව අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් කොමිසම වෙත යොමුකර ඇති වාර්තාව හා ඒ සමඟ අමුණා ඇති සිසුන් ඇතුළත් කර ගැනීමේ ලිපි අනුව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

මෙම කරුණු අනුව පාර්ශව විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරන ලද ලේඛන සලකා බැලීමේදී 2018 වර්ෂයේ 7 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කර ගැනීමේදී අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් 2008/37(1) දරණ චක්‍රලේඛනය අනුව කටයුතු නොකිරීම හේතුවෙන් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) ව්‍යවස්ථාවෙහි සඳහන් පැමිණිලිකරුවන්ගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය වී ඇති බව මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

පැමිණිලිකරුවන්ගේ දරුවන් වන ඩබ්ලිව්.වී.ඩී. දෙව්මි ශාක්‍ය විතානගේ සහ තරුෂි ඉරාෂා ගුණරත්න යන දරුවන් වගඋත්තරකාර විද්‍යාලයේ සමාන්තර ශ්‍රේණියකට ඇතුළත් කරගැනීමට කටයුතු කළ යුතුය.

2021.05-03 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

A. Shanmuganathan

අනුසුයා ෂන්මුගනාදන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Ms. Anusuya Shanmuganathan
Commissioner
Human Rights Commissioner of Sri Lanka

මහාචාර්ය. නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :- 1. ගරු අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

2. ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/